**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ සිට 2.6 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර නොගැනීම | 2.1.2 |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.4 |
| | | 3. ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම | 2.5 |
| | | 4. පොදු තැන්පත් ගිණුම සඳහා නිරීක්ෂණ | 2.6 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | මහජනයා සඳහා සේවා ඉටු කිරිමේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව<br><br>(මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරිම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.1 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

----------------------------------------------

**2.1 කාර්යසාධනය**

-----------------

**2.1.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

බෞද්ධ කටයුතු කොමසාරිස් සඳහා නිල නිවසක් ඉදිකිරීමේ කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම වූ රු.14,348,792 ක් වූ අතර ඉන් සියයට 98 ක ප්‍රමාණයක් වූ රු.මිලියන 14 ක් අවස්ථා තුනකදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. රු.මිලියන 5.6 ක් සඳහා ප්‍රගති වාර්තා ලබා ගෙන තිබුණද ඉදිකිරීම් සම්බන්ධ කළ වැඩ වාර්තා ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම කාර්යය නිමකර නොතිබුණි.

**2.1.2 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

----------------------------------------------

"තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබිය යුතුය. එහෙත් එලෙස දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2 වත්කම් කළමනාකරණය**

**(අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

බුද්ධශාසන අමාත්‍යාංශ භූමි පරිශ්‍රයේ පවතින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු 2013 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර 2017 වර්ෂය දක්වා වසර 5 ක කාලයක් තුළ ඒ සඳහා රු. 9,927,887 ක් වියදම් දරා තිබුණි. එහෙත් එහි කොටසක් තාවකාලික ප්‍රයෝජනයට ගෙන තිබුණද ගොඩනැගිල්ල වැඩ අවසන් කර ඵලදායී කටයුතු සඳහා යොදාගැනීමට 2018 ජූලි 31 දින දක්වාම අපොහොසත්ව තිබුණි.

**(ආ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධව 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය ප්‍රකාර සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසුව මාස 12 ක කාල සීමාවකින්ම හෝ කිලෝමීටර් 25,000 ක් දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන 06 ක් සඳහා එපරිදි ඉන්ධන පරීක්ෂාවක් කර ඇති බවට තහවුරු නොවිය.

**2.3 කළමනාකරණ දුර්වලතා**

**මහජනතාව සඳහා සේවා ඉටු කිරීම**

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව සියලුම රාජ්‍ය ආයතනවල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4. කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 598.77 | 578.05 | 20.72 | 3.46 |
| | මූලධන | 116.60 | 103.89 | 12.71 | 10.90 |
| | **එකතුව** | **715.37** | **681.94** | **33.43** | **4.67** |
| 2014 | පුනරාවර්තන | 766.42 | 740.72 | 25.70 | 3.35 |
| | මූලධන | 80.05 | 73.41 | 6.64 | 8.29 |
| | **එකතුව** | **846.47** | **814.13** | **32.34** | **3.82** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 962.76 | 928.63 | 34.13 | 3.54 |
| | මූලධන | 93.75 | 85.55 | 8.20 | 8.75 |
| | **එකතුව** | **1,056.51** | **1,014.18** | **42.33** | **4.00** |
| 2016 | පුනරාවර්තන | 1,216.49 | 1,102.16 | 114.33 | 9.39 |
| | මූලධන | 48.27 | 44.27 | 4.00 | 8.29 |
| | **එකතුව** | **1,264.76** | **1,146.43** | **118.33** | **9.35** |
| 2017 | පුනරාවර්තන | 1,287.89 | 1,113.55 | 174.34 | 13.54 |
| | මූලධන | 55.45 | 50.57 | 4.88 | 8.88 |
| | **එකතුව** | **1,343.34** | **1,164.12** | **179.22** | **13.34** |

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**
**------------------------------**

වැය විෂයය 09 ක් සඳහා අධි ප්‍රතිපාදනය සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 74 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**
**-------------------------------------------**

මුදල් රෙගුලාසි 214 ප්‍රකාර බැරකම් පිළිබඳ ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව විසර්ජන (සම්මත වැය) ලෙජරය පවත්වා නොතිබුණි.

**2.6 පොදු තැන්පත් ගිණුම්**
**------------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුමක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 7.43 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**600-0-0-1-36 ඇප තැන්පත් ගිණුම**
**--------------------------------------**

ලංකා බැංකුවේ අංක 0002323299 දරන ජංගම ගිණුම අවලංගු කර එකී ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.6,832,155 ක මුදල අංක 6000-0-0-1-36 දරන ඇප තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. මෙම ජංගම ගිණුම දිවයින පුරා දේවාලවල බස්නායක නිලමේවරුන් පත් කිරීමේදී ඔවුන් විසින් ඇප වශයෙන් තැන්පත් කරන මුදල් තැන්පත් කිරීම සඳහා භාවිතා කර තිබූ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවත්වාගෙන තිබූ ස්ථිර තැන්පත් සඳහා වන වාර්ෂික පොලී ආදායම ද මෙම ගිණුමට රැස්කර තිබුණි. ඇපකරුවන් විමසා මෙම මුදල් ආපසු ගෙවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සඳහා පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 349 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.481,379 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 776 | 680 | 96 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 29 | 07 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 08 | 05 | 03 |
| | එකතුව | 833 | 725 | 108 |